මා අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) වෙත පැමිණ “අහෝ අල්ලාහ්ගේ දූතයාණනි! සැබැවින්ම අපි ආගම් ලත් ජනයා වෙසෙන භූමියක වෙසෙමු. එබැවින් ඔවුන්ගේ භාජනවල අප අනුභව කළ හැකිදැ?යි විමසුවෙමු.

අබූ සඃලබා අල්-හුෂ්නී (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී. මා අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) වෙත පැමිණ “අහෝ අල්ලාහ්ගේ දූතයාණනි! සැබැවින්ම අපි ආගම් ලත් ජනයා වෙසෙන භූමියක සිටිමු. එබැවින් ඔවුන්ගේ භාජනවල අප අනුභව කළ හැකි ද? එමෙන්ම දඬයම් භූමියක සිටිමු. මාගේ දුන්නෙන් ද පුහුණු කරනු නොලැබූ මාගේ සුනඛයකුගෙන් ද පුහුණු කරනු ලැබූ මාගේ සුනඛයකුගෙන් ද දඬයම් කරමි. ඒ අනුව මට නිවැරදි වන්නේ කුමක් දැ? විමසා සිටියෙමි. එතුමා මෙසේ පැවසීය. “ඔබ පැවසූ දෑ වනාහි, - එනම් ආගම් ලත් ජනයාගේ භාජන වනාහි- ඒ හැර වෙනත් දෑ නුඹලා ලැබුවෙහු නම් ඒවායෙහි නුඹලා අනුභව නොකරනු. වෙනත් ඒවා නොලැබුවෙහු නම් ඒවා සෝදා එහි අනුභව කරනු. ඔබේ දුන්නෙන් දඬයම් කළ දෑ වනාහි, ඒ මත ඔබ බිස්මිල්ලාහ් යැයි අල්ලාහ්ගේ නාමය පවසා ඇත්නම් එය අනුභව කරනු. පුහුණු කරන ලද ඔබේ සුනඛයා මගින් දඬයම් කළ දෑ වනාහි ඒ මත ඔබ බිස්මිල්ලාහ් යැයි අල්ලාහ්ගේ නාමය පවසා ඇත්නම් අනුභව කරනු. පුහුණු කරනු නොලැබූ ඔබේ සුනඛයාගෙන් ඔබ දඬයම් කර ඇත්නම් ඔබට එය කැපීමට ලැබුණේ නම් අනුභව කරනු.” [පූර්ව සාධක සහිත හදීසයකි] [බුහාරි හා මුස්ලිම් හි වාර්තා වී ඇත]

අබූ සඃලබා (රළියල්ලාහු අන්හු) තුමා නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාට ‘සැබැවින්ම තමන් ආගම් ලත් ජනයා වෙසෙන ප්රදේශයක් අසළ ජීවත් වීම හේතුවෙන් තමන් පිරික්සුමට ලක් වන බව මතක් කර සිටියේය. මෙහි ආගම් ලත් ජනයා යනුවෙන් අදහස් කරනුයේ යුදෙව්වන් හා කිතුනුවන්ය. ඔවුන්ගේ භාජනවල අපිරිසිදුභාවය සමග ඒවායෙහි අනුභව කිරීම ඔවුනට අනුමත වන්නේදැ?යි හෙතෙම විමසා සිටියේය. එහි අනුභව කිරීම අනුමත යැයි එතුමා ඔහුට තීන්දු පිරිනැමීය. එය භාවිතා කිරීමට වඩාත්ම උචිත වනුයේ ආහාර නොවන දෑහි කොන්දේසි දෙකක් මතය. 1- ඒ හැර වෙනත් දෙයක් ඔවුහු නොලැබීම හා 2- එය ඔවුන් සේදීමය. තවදුරටත් තමන් දඬයම් භූමියක වෙනෙස බවත් තමන්ගේ දුන්නෙන්, දඬයම් කිරීමට පුහුණ කරන ලද ඒ සඳහා විනය කියා දෙන ලද තම සුනඛයාගෙන් හා එසේ පුහුණු කරනු නොලැබූ තමන්ගේ සුනඛයාගෙන් දඬයම් කිරීමට සිදු වන බවත් තමන්ට වඩාත් සුදුසු වන්නේ කුමක් ද? මෙම දඬයම් ආයුධ අතරින් අනුමත වන්නේ කුමක් ද? යන්නත් විමසා සිටියේය. දුන්නෙන් දඬයම් කරන ලද දෑ වනාහි, ඊතලය විඳින විට ඒ මත අල්ලාහ්ගේ නාමය සඳහන් කිරීමේ කොන්දේසිය මත අනුමත වන්නේය. සුනඛයින් දඬයම් කළ දෑ වනාහි ඌ පුහුණු කරනු ලැබූවෙකු නම් ඌ එවා සිටින අවස්ථාවේ අල්ලාහ්ගේ නාමය සඳහන් කළ විට එය ද අනුමත වන්නේය. පුහුණු කරනු නොලැබූ දෑ වනාහි ඌ දඬයම් කිරීම අනුමත නොවෙයි. නමුත් මිනිසා එය ජීවීව ලබා ආගමානුකූලව කපා හැරියේනම් අනුමත වන්නේය.

http://www.sunnah.global/hadeeth/si/show/2956